(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 3(3).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2011 මැයි මස 12 වැනි බ්‍රහස්පතින්දා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 125/'11

ගරු රවී කරුණානායක මහතා
ගරු පාලිත රන්ගෙ බණ්ඩාර මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා
ගරු ආර්. යෝගරාජන් මහතා
ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු අබ්දුල් හලීම් මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— කුමරන් පද්මනාදන් අත් අඩංගුවේ තබාගෙන ඇත්තේ සහ ඔහුට එරෙහිව චෝදනා ගොනුකිරීමට අදහස් කරන්නේ කුමන නෛතික ප්‍රතිපාදන යටතේද යන්න සහ අනෙක් කරුණු සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2009 අගෝස්තු 7 වැනි දින ශ්‍රී ලංකා රජයේ නිවේදනය ප්‍රකාරව, ෂන්මුගම් කුමාරන් ධර්මලිංගම් හෙවත් සෙල්වරාසා පත්මනාදන් හෙවත් කුමාරන් පත්මනාදන් හෙවත් "කේ.පී." නමින් වඩාත් ප්‍රකට පුද්ගලයා, දැනට වසරකට වැඩි කාලයක් රජයේ අත් අඩංගුවේ පසුවන හෙයින් ද,

ආයුධ ජාවාරම සහ සාපරාධී කුමන්ත්‍රණය කිරීම ඇතුළුව විවිධ චෝදනා සඳහා "කේ.පී." ජාත්‍යන්තර පොලිසියේ වඩාත් අවශ්‍ය පුද්ගල ලැයිස්තුවේ සිටින අයෙකු හෙයින් ද,

හිටපු ඉන්දීය අග්‍රාමාත්‍ය රාජීව් ගාන්ධි මහතා 1991 දී ඝාතනය කිරීම සම්බන්ධයෙන් සහ ත්‍රස්තවාදී පනත සහ ඉන්දීය පුපුරණ ද්‍රව්‍ය පනත උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ඉන්දීය ආයතනයන්ට ද ඔහු අවශ්‍ය පුද්ගලයෙකුහෙයින් ද,

ශ්‍රී මහා බෝධියට සහ දළදා මාළිගාවට එල්ලවූ ප්‍රහාර ඇතුළුව ශ්‍රී ලංකාවේ සිදුවූ ත්‍රස්ත ප්‍රහාර කිහිපයකට සෘජුව හා වක්‍රව යන දෙයාකාරයෙන්ම ඔහු සම්බන්ධ වී ඇතැයි පැවසෙන හෙයින් ද,

ඔහු දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (එල්.ටී.ටී.ඊ) වෙනුවෙන් ආයුධ මිල දී ගත් තැනැත්තා වූ හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ආයුධ ප්‍රතිසම්පාදන, සැපයුම් දාම සහ මුදල් විශුද්ධිකරණ මෙහෙයුම්වල නිරත වූ ඔහු එහි ගෝලීය කාර්යාල ජාලයක් පවත්වාගෙන ගිය හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයට අවි ආයුධ නැව් මගින් ප්‍රවාහනය කිරීමේ නියැලුණු නැව් සමාගමක් ඔහු විසින් මෙහෙයවූ බව හෙළිවී ඇති හෙයින් ද,

ශ්‍රී ලංකාවේ බැංකු මංකොල්ල කිහිපයක් ඔහු විසින් මෙහෙයවූයේ යැයි ද පැවසෙන හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයට අවි තොග සම්පාදනය කිරීමේ ඔහු නියැළී ඇති හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයට අයත් නැව් 19ක් සහ රන් රිදී තොග ඇතුළු අති විශාල වත්කම් සම්භාරයක් ඔහු පාලනය කරන්නේ යැයි පැවසෙන හෙයින් ද,

2009 ජුලි 21 වැනි දින එල්.ටී.ටී.ඊ. සංවිධානය නිකුත් කළ නිවේදනයකින් ඔහු එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නායකයා බව ප්‍රකාශ කළ හෙයින් ද,

අහිංසක ජනයා ඝාතනය කරමින් එල්.ටී.ටී.ඊ. සංවිධානය දරුණු ම්ලේච්ඡ ක්‍රියා සිදු කළ බව එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයක සඳහන් වන හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකාරකම් සඳහා මූල්‍යාධාර ලබාදීම සඳහා ජාත්‍යන්තරව මුදල් එකතු කළ පුද්ගලයා ''කේ.පී.'' බව රජය පවසන හෙයින් ද,

පහත දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අ) ''කේ.පී.'' අත් අඩංගුවේ රඳවා තබාගෙන ඇත්තේ කුමන නෛතික ප්‍රතිපාදන යටතේද;

(ආ) ''කේ.පී.'' ට එරෙහිව චෝදනා ගොනු කිරීමට අදහස් කරන්නේද, එසේ නම්, —

(i) ඔහුට නඩු පවරනුයේ කුමන නීතිය යටතේද;
(ii) චෝදනා පත්‍රයේ අන්තර්ගත කරන වැරදි කවරේද;
(iii) ඔහුට එරෙහිව චෝදනා ගොනුකිරීමට අදහස් කරනුයේ කවදාද; සහ
(iv) එම චෝදනා ගොනු කරනුයේ කවර අධිකරණයේද;

(ඇ) ඔහු වෙනත් රටකට බාරදිය යුතු බවට ඉල්ලීම් ඉදිරිපත් වී තිබේද, එසේ නම්, එබඳු ඉල්ලීම් කර ඇත්තේ කවර රටවල්ද සහ ඔහු වෙනත් රටකට බාරදීම සඳහා යෝජනා වී තිබේද;

(ඈ) රන් රිදී තොග සහ නැව් කෙරෙහි විශේෂ අවධානය සහිතව, ''කේ.පී.'' සන්තකයේ තිබූ එල්.ටී.ටී.ඊ. වත්කම්වල ඉරණම සහ පිහිටීම;

(ඉ) රටේ නීතිය යටතේ ඔහුට එරෙහිව කටයුතු නොකර ''කේ.පී.'' රඳවාගෙන සිටීමෙන්, කිසියම් නිලධාරියෙකු හෝ නිලධාරීහු ද්‍රෝහි හැසිරීම සහ රාජකාරිය පැහැර හැරීම සම්බන්ධයෙන් වරදකරුවන් වන්නේද යන ප්‍රශ්නය පිළිබඳව ද විශේෂ කාරක සභාව සිය අවධානය යොමු කළ යුතුය.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යැමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.